# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1950/5 – 2016 ජනවාරි මස 18 වැනි සඳුදා - 2016.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)



# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු මැද පළාතේ පළාත් සභාව

බලය පැවරීමේ නියෝගය

උතුරු මැද පළාත් සභාවේ 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාත් ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ රංජිත් සමරකෝන් වන මම උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමඟ කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ බලතල වලින් උතුරු මැද පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්වරයාට සහය වීමට සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය) සහ සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරේ රාජකාරී ඉටු කිරීම සඳහා පත්කර ඇත්තා වූ පහත සඳහන් උපලේඛනයෙහි I වැනි තීරුවේ සඳහන් අය වෙත එම උපලේඛනයේ III වැනි තීරුවේ සඳහන් සියලු බලතල II වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

සමරකෝන් මුදියන්සේලාගේ රංජිත් සමරකෝන්,<br>
ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, සමුපකාර,<br>
වෙළඳ හා ආහාර සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍ය<br>
උතුරු මැද පළාත.

2015 දෙසැම්බර් මස 01 වැනි දින.

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| 01. විජේසුන්දර මුදියන්සේලාගේ එරන්දිකා කුමාරි බණ්ඩාරනායක | 2015.12.01 | උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමඟ කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 03, 04, 05, 06, 07, 08, 44, 45, 58 (58 (3), 58(4) හා 58(5) හැර) 59 වගන්තියේ (1) ආ හැර යටතේ |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| | | රෙජිස්ට්‍රාර්ගේ බලතල හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ සම්පාදිත 1973 සමුපකාර රීති මාලාවේ 04, 11, 16(II), 19, 33, 35, 37, 39, 40, 41, (41(I)අ හැර) 42, 49, (49(XII හැර), 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල. |
| 02. උඩතැන්නේ ගෙදර ඒකනායක | 2015.12.01 | උතුරු මැද පළාත් සභාවේ 2011 අංක 01 දරන සමුපකාර සමිති සංශෝධන ප්‍රඥප්තිය සමඟ කියවෙන 2009 අංක 05 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 03, 04, 05, 06, 07, 08, 44, 45, 58 (58 (3), 58(4) හා 58(5) හැර) 59 වගන්තියේ (1) ආ හැර යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල හා 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 61 වැනි වගන්තිය යටතේ සම්පාදිත 1973 සමුපකාර රීති මාලාවේ 04, 11, 16(II), 19, 33, 35, 37, 39, 40, 41(41(I)අ හැර) 42, 49, (49(XII) හැර) 51, 52 සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්ගේ බලතල. |

02-20

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.